5 මෙහෙයුම් පද්ධති

මෙම පාඩම හැදෑරීමෙන් ඔබට

- මෙහෙයුම් පද්ධතියක් යනු කුමක් ද?
- මෙහෙයුම් පද්ධතියක කාර්යභාරය
- පරිශීලක අතුරු මුහුණත්
- වින්ඩෝස් මෙහෙයුම් පද්ධතිය භාවිතයෙන් කටයුතු කිරීම

පිළිබඳ ව මනා අවබෝධයක් ලබා ගැනීමට හැකි වනු ඇත.

5.1 හැඳින්වීම

තොරතුරු සන්නිවේදන විෂය හදරණ සිසුවකු වශයෙන් ඔබ නිතර පරිගණකය භාවිත කරන්නකු විය හැකි ය. පරිගණකයේ ක්‍රියාකාරිත්වයට අත්‍යවශ්‍ය මෘදුකාංග පද්ධතිය කුමක් දැයි විමසුව හොත් ඔබගේ පිළිතුර විය යුත්තේ මෙහෙයුම් පද්ධතිය (Operating Systems) යන්නයි. මෙහෙයුම් පද්ධතිය නොමැති ව අපට පරිගණකය භාවිත කළ නොහැකි ය. පරිගණකය ක්‍රියාත්මක කළ විට මෙහෙයුම් පද්ධතිය ස්වංයක්‍රීය ව ක්‍රියාත්මක වී අපට පරිගණකය භාවිත කිරීමට අවශ්‍ය පරිසරය සකසා දෙයි. අද බහුල ව භාවිත කරන මෙහෙයුම් පද්ධතිවලට උදාහරණ ලෙස MS DOS, Windows (XP, ME, Vista ආදිය), UNIX, Linux සහ Mac OS හැදින්විය හැක.

පරිගණක මෙහෙයුම් පද්ධතියක ප්‍රධාන කාර්යයන් වනුයේ පරිගණක මෘදුකාංග සහ දෘඪාංග කළමනාකරණය කර දෘඩාංග සහ මෘදුකාංග සහ මෘදුකාංගවල ඇති සංකීර්ණ බව

භාවිත කරන්නන්ගෙන් සඟවා පරිශීලකයන්ට එම සම්පත්වලට ප්‍රවේශ වීමට අතුරු මුහුණතක් සැපයීම යි. එමෙන් ම පරිගණක පද්ධතියකට අයත් සියලු ම උපාංග ඒකාබද්ධ ව ක්‍රියාකිරීම මගින් ඒවායේ උපරිම ඵලය ලබා ගැනීම සඳහා යොදවා ගැනීම ද පරිගණක මෙහෙයුම් පද්ධතියෙහි කාර්යභාරයකි. මෙහි දී ක්‍රමලේඛ (Programs) ක්‍රියාත්මක වීම වැනි අභ්‍යන්තර තොරතුරු, මෙහෙයුම් පද්ධතිය මගින් පිටතට පෙන්නුම් නොකරන අතර පරිගණකය භාවිත කරන්නාට පහසු මිත්‍රශීලි අතුරු මුහුණතක් පිටතට පෙන්නුම් කරයි.

නවීන පරිගණක පද්ධතිය සහ පරිශීලකයා අතර සම්බන්ධතාව පහත ආකෘතිය මගින් පෙන්නුම් කළ හැකි ය.



රූපය 5.1

පරිශීලකයා තම කටයුතු ඉටුකර ගැනීම සඳහා යෙදුම් මෘදුකාංග සහ උපයෝගිතා මෘදුකාංග භාවිත කරයි. කෙසේ වුව ද මෙම මෘදුකාංගවලට පරිගණක දෘඩාංග සමග සෘජු ව කටයුතු කළ නො හැකි ය. බොහෝ අවස්ථාවල දී දෘඩාංග සහ මෙම මෘදුකාංග අතර සම්බන්ධීකරණය මෙහෙයුම් පද්ධතිය මගින් සිදුකරනු ලබයි.

යෙදුම් මෘදුකාංග (Application Software)

එදිනෙද වැඩ කටයුතු කිරීම සඳහා උපයෝගී වන මෘදුකාංග යෙදුම් මෘදුකාංග යටතට ගැනේ.

උදා -: වදන් සැකසුම් මෘදුකාංග (Word Processing Packages), පැතුරුම්පත් මෘදුකාංග (Spreadsheet Packages)

උපයෝගිතා මෘදුකාංග (Utility Software)

මෙහෙයුම් පද්ධතියේ ක්‍රියාවලිය තව දුරටත් කාර්යක්ෂම කිරීමට හා වැඩි දියුණු කිරීමට භාවිත කරන මෘදුකාංග

උදා -: ප්‍රතිවෛරස මෘදුකාංග (Anti virus Software)

දෝෂ සෙවීමේ හා නිරාකරණය කිරීමේ මෙවලම් (Trouble Shooting Tools/ Diagnostic tools)

මෙහෙයුම් පද්ධතියක ක්‍රියාකාරිත්වය

මෙහෙයුම් පද්ධතියක මූලික ක්‍රියාකාරිත්වය කොටස් 5කට වෙන් කර දැක්විය හැකි ය.

1. ක්‍රියාවලි කළමනාකරණය (Process Management)
2. මතක කළමනාකරණය (Memory Management)
3. උපාංග කළමනාකරණය (Device Management)
4. ගොනු කළමනාකරණය (File Management)
5. ආරක්ෂණ කළමනාකරණය (Security Management)

1. ක්‍රියාවලි කළමනාකරණය

ක්‍රියාවලි කළමනාකරණය නූතන මෙහෙයුම් පද්ධතිවල මූලික කාර්යයකි. මධ්‍ය සැකසුම් ඒකකය තුළ ක්‍රියාත්මක වෙමින් පවතින වැඩසටහන් කොටසක් ක්‍රියාවලියක් ලෙස හැඳින්වේ. කෙසේ වුව ද මධ්‍ය සැකසුම් ඒකකය තුළ එක් අවස්ථාවක දී ක්‍රියාත්මක වන්නේ එක් ක්‍රියාවලියකි. වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක වීමේ දී තෝරාගත් අනුපිළිවෙළකට ඒවායේ වූ ක්‍රියාවලි වරකට එක බැගින් ක්‍රියාත්මක කරනු ඇත.

2. මතක කළමනාකරණය

විවිධ කාර්යයන් සඳහා මතකයෙහි ඉඩ සලසා දීම ද මෙහෙයුම් පද්ධතියට අයත් කාර්යයකි. එකවර විවිධ ක්‍රියාවලි කීපයක් සිදු කරන අවස්ථාවල දී ඒවා අතර ඝට්ටනයක් සිදු නොවන පරිදි මෙහෙයුම් පද්ධතිය මගින් පරිගණක මතකය සංවිධානාත්මක ව කළමනාකරණය කරනු ලැබේ. යම් කිසි කාර්යයක් සම්පූර්ණයෙන් ඉටුකර අවසන් වූ පසු වෙනත් කාර්යයක් සඳහා මතකයෙහි ඉඩ සලසා දෙමින් පළමු කාර්යය සඳහා ලබා දුන් මතකය නිදහස් කර දීම ද මෙහෙයුම් පද්ධතිය මගින් සිදු කරයි.

පරිගණක පරිශීලකයන් වැඩි ගණනක් සිටින අවස්ථාවල දී එකිනෙකාගේ කාර්යයන් එකිනෙක ඝට්ටනය නොවන පරිදි පරිගණක මතකය කළමනාකරණය කිරීම ද මෙහෙයුම් පද්ධතියේ වගකීම ය.

3. උපාංග කළමනාකරණය

උපාංග කළමනාකරණය පරිගණක මෙහෙයුම් පද්ධතිය මගින් කළ යුතු තවත් කාර්යයකි. විවිධාකාර උපාංග රාශියක් විවිධාකාර පැති ඔස්සේ (බහුමාන) කළමනාකරණය කිරීමට මෙහෙයුම් පද්ධතියට සිදු වේ. පරිගණක පද්ධතියක දෘඩාංග කොටස් (උදහරණ ලෙස මුද්‍රණ යන්ත්‍ර, යතුරු පුවරුව, මූසිකය යනාදිය) මෙම උපාංග ලෙස හැඳින්විය හැකි ය. මෙම උපාංගවල ක්‍රියාකාරී ශීඝ්‍රතාව, තොරතුරුවල ප්‍රමාණය, එහි අරමුණු, තොරතුරු ගලායාමේ දිශාව, තොරතුරු සම්ප්‍රේෂණය කිරීමට භාවිත වන නියමාවලිය (Communication Protocol [සන්නිවේදන රීති]) මෙම උපාංග කළමනාකරණයට බලපායි.

නිදසුනක් වශයෙන් දෘඪ තැටියේ ඇති ලිපියක් කියවීමට අවශ්‍ය නම්, දෘඪ තැටියට ප්‍රවේශ වීම ඉතා සරල කටයුත්තක් බව පෙනුණ ද එය කුඩා කාර්යයන් ගණනාවක එකතුවක් ලෙස සැලකිය හැකි ය. මෙම කර්තව්‍යය ආදාන/ප්‍රතිදාන දෘඩාංග සහ මෘදුකාංග (I/O Hardware and I/O Software) සම්බන්ධීකරණය මගින් ඉටු වෙයි.

4. ගොනු කළමනාකරණය

දත්ත සහ තොරතුරු ද්විතීයික ආචයනයෙහි ගොනු ආකාරයට තැන්පත් කරනු ලබයි. මෙම ගොනු පරිගණකයේ තොරතුරු ගබඩා කිරීම සඳහා ඔබ භාවිත කරන්නට ඇත. නැවත මෙම තොරතුරු ලබා ගැනීම හා භාවිත කිරීම ද සිදු කරන්නට ඇත. මෙසේ ලිපිගොනු අපට නැවත අවශ්‍ය වන තුරු යම් තැනක ගබඩා කොට තැබීමත් ඒවා මනා ලෙස කළමනාකරණය කිරීමත් පරිගණකයට ඉතා වැදගත් වේ.

මෙහෙයුම් පද්ධතිය මගින් ගොනු සෑදීම (Create), නම් කිරීම (Name), ගොනු ක්‍රමානුකූල ව තබා ගැනීම (Organize), ප්‍රවේශ වීම (Access) භාවිත කිරීම (Use) සහ ආරක්ෂා කිරීම (Protect) යන ක්‍රියාවන් කළමනාකරණය කිරීම ගොනු කළමනාකරණය ලෙස හැඳින්වේ. ඩිරෙක්ටරි යනු ගොනුවක් සඳහා භාවිත කරන තවත් නමකි.

මෙම ගොනු කළමනාකරණය මගින් ගොනු නාමාවලි/ගොනු ආවරණ (Files, Directories/Folders) සෑදීම (Create), පිටපත් ලබා ගැනීම (Copy), තවත් ස්ථානයකට ගොනුව යැවීම (Move), එහි නම වෙනස් කිරීම (Rename) සහ ලිපිගොනු නැවත ලබා ගැනීම (Retrieve) සහ මකා දැමීම (Delete), සඳහා අවස්ථාව සලසා දෙයි.

5. ආරක්ෂණ කළමනාකරණය

පරිගණක පද්ධතියක් බාහිර සහ අභ්‍යන්තර උපද්‍රවවලින් ආරක්ෂා කර ගැනීම සඳහා මෙහෙයුම් පද්ධතිය මගින් ගනු ලබන ක්‍රියාමාර්ග ආරක්ෂණ කළමනාකරණය යටතේ සාකච්ජා කෙරේ.

උදා: පරිගණක පද්ධතියකට අනවසර ඇතුළු වන්නන් පාලනය කිරීම සඳහා භාවිතා කරන පරිශීලක නම (User Name) හා යොදන මුරපද (Password) භාවිතය

5.2 පරිශීලක අතුරු මුහුණත් User Interfaces

පරිගණක පරිශීලක අතුරු මුහුණතෙහි ස්වරූපය අනුව පරිගණක අතුරු මුහුණත් දෙයාකාරයක් පවතී.

1. විධාන පේළි අතුරු මුහුණත් (CLI Command Line Interfaces)

2. චිත්‍රක පරිශීලක අතුරු මුහුණත් (GUI Graphical User Interfaces)

1. විධාන පේළි අතුරු මුහුණත්



රූපය 5.2 MS DOS අතුරු මුහුණත

විධාන පේළි අතුරු මුහුණත් මෙහෙයුම් පද්ධතිවල දී තිරය මත ප්‍රේරකයක් (prompt) දක්නට ලැබෙන අතර අවශ්‍ය කරන උපදෙස් හා විධාන (syntax) නිවැරදි ආකාරයෙන් යතුරුලියනය කළ යුතු ය. විධාන පේළි අතුරු මුහුණත් MS DOS, Unix සහ Linux මෙහෙයුම් පද්ධතිවල දැකිය හැකි ය.

චිත්‍රක පරිශීලක අතුරු මුහුණත

පරිශීලකයාට පරිගණක භාවිතය වඩාත් පහසු හා සරල කරනු පිණිස මෙහෙයුම් පද්ධතියේ රූපක/චිත්‍රක අතුරු මුහුණතක් භාවිත කෙරේ. මෙහි දී විධාන මතක තබා ගැනීම අවශ්‍ය නොවන අතර රූපක/චිත්‍රක භාවිතයෙන් ඉතා සරල ව පරිගණකය හැසිරවීමට ඉඩ සලසා දෙයි.

චිත්‍රක පරිශීලක අතුරු මුහුණත් පාදක කරගත් මෙහෙයුම් පද්ධතිවල පහත දැක්වෙන ප්‍රධාන සංරචක දැකිය හැකි ය.

1. කවුළු (Windows)
2. නිරූපක/අයිකන (Icons)
3. මෙනු (Menus)
4. දක්වනය (Pointer)

1. කවුළු

චිත්‍රක පරිශීලක අතුරු මුහුණත් සහිත මෙහෙයුම් පද්ධතිවල දී දක්නට ලැබෙන ප්‍රධාන පහසුකමක් වන්නේ එක්එක් අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා වෙන්වෙන් ව පවත්නා කවුළු ය. මෙම කවුළුවල ප්‍රමාණ අවශ්‍ය පරිදි සකස් කිරීම ද ඒවා තිරයේ අවශ්‍ය ස්ථානයක පිහිටුවීම ද කළ හැකි ය. එසේ ම, මෙම කවුළු හැකිළවීම (Minimize) සහ විහිදුවීම (Maximize) කළ හැකි ය.

2. නිරූපක / අයිකන

විධාන, ගොනු, කවුළු නියෝජනය කරන කුඩා චිත්‍රක/පින්තූර හෝ සංකේත නිරූපක / අයිකන ලෙස හැඳින්වේ. මෙම අයිකන භාවිතා කරමින් අවශ්‍ය විධාන ක්‍රියාත්මක කිරීම සිදු කළ හැකි ය.

3. මෙනු

තෝරාගැනීම සඳහා ඇති අවස්ථා ලැයිස්තුවක් මෙනුවක් ලෙසින් හැඳින්වේ. බොහෝ විට ප්‍රධාන මෙනු තීරුව (Menu Bar) යටතේ උපමෙනු (Sub Menu) දැකිය හැකි ය.

4. දක්වනය

පරිගණක තිරයේ මූසිකය පවතින ස්ථානය පෙන්වීම සඳහා දක්වනය (mouse pointer) භාවිතා කෙරේ. බොහෝ අවස්ථාවල දී දක්වනය දක්නට ලැබෙන්නේ ඊ හිසක හැඩයෙනි.

වැඩතලය (Desktop)

පරිගණකය ආරම්භ කළ විට වැඩතලය දිස්වේ. අවශ්‍ය කාර්යයන් සඳහා මේ මත ඇති අයිකන හෝ කාර්ය තීරුව යොදගනිමින් අවශ්‍ය කාර්යය කරගත හැකි ය.

චිත්‍රක පරිශීලක අතුරු මුහුණතක් පළමුවෙන් ම නිර්මාණය කළේ 1970 දශකයේ 'Xerox' සමාගමේ 'Palo Alto' පර්යේෂණ මධ්‍යස්ථානයයි. 'ඇපල් මැකින්ටොෂ් (Apple Macintosh) පරිගණකවල මෙම චිත්‍රක පරිශීලක අතුරු මුහුණතක් ප්‍රචලිත වීමත් සමග ම ඒවා බොහෝ මෙහෙයුම් පද්ධති සඳහා ද හඳුන්වාදීම ආරම්භ විය. (රූපය 5.4 බලන්න)



රූපය 5.3 වින්ඩෝස්හි චිත්‍රක පරිශීලක අතුරු මුහුණත

චිත්‍රක පරිශීලක අතුරු මුහුණතක් භාවිත කිරීමේ වාසි

1. චිත්‍රක පරිශීලක අතුරු මුහුණතක අයිකන, මෙනු පරිශීලකයාට ඉතා සරල ව භාවිත කළ හැකි ය. ලක්ෂීය උපාංගයේ (Pointing Device) දක්වනය (Mouse Pointer) පරිගණක තිරය පුරා චලනය කළ හැකි වීමෙන් අයිකන හා මෙනු තෝරා ගැනීම මෙන් ම ක්‍රියාත්මක කිරීම ද ඉතා සරල ව කළ හැකි ය. මෙහි දී විධාන මතක තබා ගැනීමේ අවශ්‍යතාවක් නැත.

2. පරිගණක ක්‍රමලේඛ හෝ පරිගණක හැසිරවීම පිළිබඳ මනා දැනුමක් නොලද පරිශීලකයන්ට පවා මෙම චිත්‍රක පරිශීලක අතුරු මුහුණත් භාවිතයෙන් පරිගණක පරිශීලනය කළ හැකි ය.

3. බොහෝ අවස්ථාවල දී තිරය මත ඇති අයිකන විස්තර කරන කුඩා වාක්‍ය ඛණ්ඩයක් (Tooltip) දැන ගැනීමට ලැබීමෙන් අදාළ ක්‍රියාව කුමක් දැයි වටහා ගැනීමට ලැබේ.

5.3 වින්ඩෝස් මෙහෙයුම් පද්ධතියේ ගොනු සහ ෆෝල්ඩර (Files and folders)

වින්ඩෝස් එක්ස්ප්ලෝරර්(ර්) (Windows Explorer)

වින්ඩෝස් එක්ස්ප්ලෝරර්(ර්) යනු 'Microsoft Windows' මෙහෙයුම් පද්ධතියේ අඩංගු ගොනු කළමනාකරණ පද්ධතිවල (File Management Systems) රූපක පරිශීලක මුහුණුවරයි (Graphical User Interface). එය ගොනු හා ෆෝල්ඩරවලට ප්‍රවේශ වීමට ඉඩ සලසන අතර පරිගණකයේ දෘඪාංග හා පරිගණකයට සම්බන්ධ සියලු ම මතක ගබඩාවලට පිවිසීමට එක ම කවුළුවකින් ඉඩ සලසා දෙයි.

'My Computer' අයිකනය මත මවුසයේ දකුණු බොත්තම ක්ලික් කර Explore තෝරා ගැනීම මගින් හෝ යතුරු පුවරුවේ වින්ඩෝස් යතුර හා යතුරු පුවරුවේ ඊ අකුර (E) එකවර තද කිරීම මගින් හෝ Start මෙනුව හරහා වින්ඩෝස් එක්ස්ප්ලෝරර්(ර්)වලට පිවිසිය හැකි ය.

දැනට බෙහෙවින් ප්‍රචලිත වින්ඩෝස් එක්ස්පී (Windows XP) මෙහෙයුම් පද්ධතියට අනුව මෙම ඡේදය විස්තර කෙරෙන අතර අනෙකුත් වින්ඩෝස් පද්ධතිවල සුළුසුළු වෙනස්කම් දක්නට ලැබේ.



රූපය 5.4 වින්ඩෝස් එක්ස්ප්ලෝරර්(ර්) කවුළුව

මෙම වින්ඩෝස් එක්ස්ප්ලෝරර්(ර්) කවුළුවෙහි (රූපය - 5.5 බලන්න) ඉහළින් ම ප්‍රධාන මෙනුව දක්නට ඇත. ඊට පහළින් මෙවලම් තීරු (Toolbars) තුනක් දක්නට ලැබේ.

එනම්,

1. සම්මත මෙවලම් තීරුව (Standard Toolbar)
2. ලිපින තීරුව (Address Bar)
3. සන්ධාන (Links)

එම මෙවලම් තීරු තුනයි.

1. සම්මත මෙවලම් තීරුව

මෙය ඔබට අවශ්‍ය ආකාරයට වෙනස් කරගත හැකි ය. මෙම මෙවලම් තීරුවෙහි ඇති මෙවලම (Tools) භාවිතයෙන් යම්යම් විධාන ක්‍රියාත්මක කළ හැකි ය.

View ➔ Toolbars ➔ Customize

ආකාරයට ඔබට අවශ්‍ය පරිදි මෙවලම් වෙනස් කර ගත හැකි ය.

2. ලිපින තීරුව

බාහිර හා අභ්‍යන්තර දත්ත ගබඩාවලට ප්‍රවේශ වීමට අමතර ව ඉන් පිටත වෙබ් පිටුවලට ප්‍රවේශ වීමට මේ තුළින් අවස්ථාව ලබා දේ. මෙම ලිපින තීරුව විධාන පේළියක් ලෙස ද (Command Line) භාවිත කළ හැකි ය.

3. සන්ධානය

ඔබ නිතර සැරිසරන වෙබ් පිටු සඳහා කෙටි මං යොදා ගනිමින් ඔබට සිතැඟි පරිදි සන්ධාන මෙවලම් තීරුව සකස් කරගත හැකි ය.



පැවරුම 5.1

1. ලිපින තීරුව භාවිතයෙන් 'My Documents' හි ඇති ඔබගේ ලිපිගොනු ආවරණය ගවේෂණය කරන්න.
2. සම්මත මෙවලම් තීරුව ඔබට සිතැඟි පරිදි සකස් කරන්න.
3. ඔබ නිතර පිවිසෙන සෙවුම් යන්ත්‍රයට අදාළ කෙටි මග සන්ධාන මෙවලම් තීරුවට ඇතුළත් කරන්න.

ඉහත සඳහන් කළ මෙවලම් තීරුවලට පහළින් ඇති ක්ෂේත්‍රය (Data area) සාමාන්‍යයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදී ඇත.

ගවේෂණ තීරුව (Explore Bar)

ගවේෂණ තීරුව වින්ඩෝස් එක්ස්ප්ලෝර(ර්)වල වම්පස සිරස් තීරුව වේ. ඔබගේ පරිගණකයේ ඇති මතක ගබඩාවල අනුක්‍රමික ව්‍යුහය (Hierarchical view) මෙහි දී දිස්වේ.

ෆෝල්ඩර දර්ශන තීරුවේ ෆෝල්ඩරයක් ඉදිරියෙන් ඇති + ලකුණ මත ක්ලික් කිරීම මගින් එම ෆෝල්ඩරයේ අන්තර්ගතය විහිදු දැක්විය හැකි ය. තව ද ෆෝල්ඩරයට ඉදිරියෙන් ඇති ඍණ ලකුණ මත ක්ලික් කිරීමෙන් එම අන්තර්ගතය පෙන්වා ඇති ෆෝල්ඩරය හකුළුවා ගනී.

ගවේෂණ තීරුවේ (Explore Bar) ප්‍රධාන හෝ උප හෝ ෆෝල්ඩරය ක්ලික් කළ විට එහි අන්තර්ගතය දකුණුපස තිරයේ පෙන්නුම් කරයි.

ධාවකයන් (Drives)

Windows XP හිදී A: , B: වලින් නම්‍යතැටි (Floppy disk drive) ද ඉන්පසු 'C:' සිට ඉදිරි අක්ෂරවලින් දෘඪ තැටි ද, සංගත තැටි ද, සංඛ්‍යාංක බහුවිධ තැටි ද ආදී ආචයන ඒකක ආදේශ කර ගනී.

ප්‍රතිචක්‍රීකරණ බඳුන (Recycle bin)

යම් කිසි ගොනුවක් මකා දැමූ විට එම ගොනුව පිහිටි ස්ථානයෙන් ඉවත්ව ප්‍රතිචක්‍රීකරණ බඳුන නම් වූ ෆෝල්ඩරයට එක් වෙයි. අවශ්‍ය නම් එය නැවත ලබා ගත හැක. කෙසේ වුව ද එම ගොනුව ප්‍රතිචක්‍රීකරණ බඳුනෙන් මකා දැමුව හොත් නැවත ලබා ගැනීමේ අවස්ථාව නැති වී යයි.



1. පහත දැක්වෙන ෆෝල්ඩර් ආකෘතිය වැඩතලය මත සකස් කරන්න.



2. MSPaint වැඩසටහන භාවිත කොට රූපයක් ඇඳ එය PaintEx1 ලෙස ඔබ සකස් කළ 'Paint' ෆෝල්ඩරය තුළ තැන්පත් කරන්න.
3. PaintEx1 හි පිටපතක් 'Documents' ෆෝල්ඩරයට පිටපත් කරන්න.
4. Documents ෆෝල්ඩරයේ ඇති PaintExi ගොනුවෙහි නම My Picture ලෙස වෙනස් කරන්න.
6. Documents ෆෝල්ඩරයේ ඇති My Pixture ගොනුව මකා දමන්න.
7. දැන් ප්‍රතිචක්‍රීකරණ බඳුන (Recycle Bin) නිරීක්ෂණය කර එහි දක්නට ලැබෙන දේ සටහන් කරන්න.

ගොනු සහ ගොනු දිගු (Files and File Extensions)

පරිගණකයේ දෘඪ තැටියෙහි හෝ වෙනත් ඉවත් කළ හැකි තැටි (CD/DVD) හෝ විශ්ව ශ්‍රේණිගත බසය (Universal Serial Bus) මගින් සම්බන්ධ කර ඇති මෙවලම් ආදියෙහි තැන්පත් කොට ඇති ගොනුවක් හඳුනා ගනු ලබන්නේ එහි නාමයෙනි. මෙම ගොනු නාමවල දිගුවක් (extensions) මගින් ගොනු ආකාරය හඳුනා ගත හැක. උදහරණයක් ලෙස 'exe' ලෙස දිගුවක් ඇති නම් එම ගොනුව මත 'double click' කිරීම මගින් එය ක්‍රියාත්මක කළ හැකි ය. 'doc' යන දිගුවෙන් 'MS Word' මගින් නිර්මාණය කළ වදන් සැකසුම් ගොනුවක් දක්වේ. ගොනු සහ ගොනු දිගුව වෙන් කිරීම සඳහා තිත (Dot) භාවිත කරයි.



පැවරුම 5.3

ඔබගේ පරිගණකයේ ඇති ගොනු දිගු ලැයිස්තුවක් සකසන්න.

ඔබේ අමතර දැනුමට ...

ලිනක්ස් (Linux) මෙහෙයුම් පද්ධතිය

1969 දී කෙන් තොම්සන් (Ken Thompson), ඩෙනිස් රිචී (Dennis Ritchie) සහ පිරිස විසින් යුනික්ස් (Unix) නැමැති මෙහෙයුම් පද්ධතිය නිර්මාණය කරන ලදී. යුනික්ස් පාදක කරගෙන බීඑස්ඩී (BSD), සොලාරිස් (Solaris), MacOS වැනි මෙහෙයුම් පද්ධති නිර්මාණය කෙරිණි. මීට අමතර ව තම ඉගැන්වීම් කටයුතු පහසු කර ගැනීමට, යුනික්ස්හි සංකල්ප ආදර්ශ කර ගෙන ඇන්ඩෲව් ටනෙන්බම් (Andrew Tanenbaum) විසින් මිනික්ස් (Minix) නම් මෙහෙයුම් පද්ධතිය නිර්මාණය කරන ලදී.

හෙල්සින්කි සරසවියේ පරිගණක විද්‍යාව හදාරමින් සිටි ලිනුස් ටොර්වල්ඩ්ස් (Linus Torvalds) පරිගණකයක් ලබාගැනීමෙන් පසු ව, මිනික්ස් භාවිත කරමින් සිටියේ ය. එයින් සෑහීමට පත් නො වූ ඔහු තමාගේ ම මෙහෙයුම් පද්ධතියක් නිර්මාණය කිරීම ආරම්භ කළේ ය. මෙම නිර්මාණය මිනික්ස් වලට සමානකම් දැක්වුවත් මිනික්ස් වලින් ගත් ක්‍රමලේඛන එහි අඩංගු කළේ නැත. මෙම නව මෙහෙයුම් පද්ධතිය ලිනක්ස් (Linux) ලෙසින් නම් කෙරිණි. පසු ව මැසෙචුසෙට්ස් (Massachuset) හි නිදහස් මෘදුකාංග පදනමෙහි (Free Software Foundation) නිර්මිත ග්නු (GNU) මෘදුකාංග ඇතුළත් කිරීමෙන් ලිනක්ස් ඉතා උසස් තත්ත්වයේ මෙහෙයුම් පද්ධතියක් බවට පත් විය. එම හේතුවෙන් මෙම මෙහෙයුම් පද්ධතියට ග්නු/ලිනක්ස් (GNU/Linux) යන නම ද භාවිත කෙරෙයි.

මුල සිට ම, ලිනක්ස්, නිදහස් සහ විවෘත කේත (Free and Open Soure Software - FOSS) මෙහෙයුම් පද්ධතියක් ලෙස නිර්මාණය කෙරිණි. මුල දී සරසවිය තුළ මිතුරන් අතර පමණක් භාවිත කළ ග්නූ /ලිනක්ස් (GNU/Linux) පසු ව ලොව පුරා ප්‍රචලිත විය. ඒ සමග ම ලිනක්ස් තුළ පිහිටුවිය හැකි මෘදුකාංග ලොව පුරා නිර්මාණය වන්නට විය. එකිනෙකාගේ අවශ්‍යතාවලට අනුව සැකසුණු මෙම මෘදුකාංග වර්තමානයේ වාණිජ මෘදුකාංගවලට තරගකාරී ලෙස ඉදිරියට ඇදෙමින් පවතී.

ලෝකයේ විවිධ සමාගම් සහ සංගම් නිදහස් සහ විවෘත කේත මෙහෙයුම් පද්ධතිය හා මෘදුකාංග විවිධ අවශ්‍යතාවලට ගැළපෙන පරිදි වෙනස්කම්වලට භාජනය කර, අන්තර්ජාලය හරහා හා සංයුක්ත තැටි ආකාරයට ලබාගැනීමට හැකිවන සේ බෙදහරිනු ලැබේ. මෙම බෙදාහැරීම් අතර උබුන්ටු, ඩෙබියන්, රෙඩ්හැට්, සුසේ වැනි බෙදාහැරීම් බොහෝ ජනප්‍රිය වී ඇත. මේවා Linux හි සංස්කරණ වේ. මෙම විවිධ බෙදාහැරීම් සජීවී තැටි හා පිහිටුම් තැටි යන දෙයාකාරයෙන් පවතී.

වින්ඩෝස් (Windows) මෙහෙයුම් පද්ධතියේ මෙන් නොව, ලිනක්ස් තුළ භාවිත කිරීමට නිර්මාණය කළ විවිධ අතුරු මුහුණත් පරිසරීතීන් (environment) ඇත. මේ අතර Gnome, KDE3, KDE4, XFCE4, Enlightenment යන ඒවා මේ සඳහා උදහරණ ලෙස දැක්විය හැකි ය. රූපය 5.5 හි දක්වා ඇත්තේ Gnome අතුරු මුහුණත් පරිස්රීතියේ තිර දර්ශනයකි. අතීතයේ ලිනක්ස් භාවිත කිරීම සාමාන්‍ය පරිශීලකයින්ට ද තරමක් අපහසු වුවත් වර්තමානය වන විට නවකයකුට වුව ද එය භාවිත කිරීම අපහසු නො වේ.

රූපය 5.5

Gnome අතුරු මුහුණත් පරිස්රීතියේ තිර දර්ශනයක්